# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2203/28 - 2020 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2020.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් අයකළ යුතු බද්දෙහි ප්‍රතිශතය පහත උපලේඛනයේ විස්තර කරන ආකාරයෙන් පනවා 2021 සහ 2022 වර්ෂ සඳහා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොළඹ මහ නගර සභාව විසින් 2020.07.30 දිනැතිව සභා සම්මත කර ඇති යෝජනාව, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

1A - PG 5168 — 35 (2020/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| අනු අංක | කාණ්ඩය | විනෝද කටයුත්තෙහි ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | A | * සිනමා ශාලා | 10% |
| 02 | B | * විදේශීය කලාකරුවන් සහභාගි වන සියළුම ප්‍රසංග<br>* සියළුම සැණකෙළි, ශූර ක්‍රියා (සර්කස්)<br>* වාණිජ පරමාර්ථයෙන් පවත්වනු ලබන දේශීය ශිල්පීන් සහභාගි වන සියළු ප්‍රසංග සඳහා | 12% |
| 03 | C | * අන්තර්ජාතික ක්‍රීඩා තරඟ | 13% |
| 04 | D | * දේශීය ශිල්පීන් සහභාගි වන ආහාරපාන රහිතව මිල වන DJ ප්‍රසංග, නැටුම් සංදර්ශන, Sing Alone සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග<br>* මැජික් සංදර්ශන, විචිත්‍රාංග සංදර්ශන හා විචිත්‍රාංග තරඟ<br>* හෝලි උත්සවය<br>* සුබසාධක සංගම්, ආදි ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති හා සමාජ සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රසංග | 10% |
| 05 | E | * ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් මූලිකව පවත්වන ලබන ප්‍රසංග (වර්ෂයකට උපරිම ප්‍රසංග තුනකි)<br>* දේශීය ක්‍රීඩා තරඟ<br>* දේශීය වේදිකා නාට්‍යය ගීත සහිත ප්‍රසංග | 08% |
| 06 | F | * දැනට ප්‍රසිද්ධ කලාකරුවෙකු විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංගයක් සඳහා (ජීවිත කාලය තුළ එක් වරක් සඳහා පමණක්)<br>* පාසලක් විසින් පාසලේ සුබසාධනය සඳහා පවත්වනු ලබන අයදුම්කරු විදුහල්පති වන, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිත ප්‍රසංග<br>* පාසලක් හෝ ආදී ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලයීය සංගමයක් පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරඟ හා පාසැල් ක්‍රීඩා සංගම් විසින් පවත්වන තරඟාවලි<br>* උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුබසාධනය සඳහා පවත්වන විනෝද කටයුතු | 07% |
| 07 | G | * Dinner Dance/Sing Alone (ආහාර පාන සමඟ මිල වන රු.3.000/ට වැඩි ප්‍රවේශපත්) | 07% |
| 08 | H | * දැනට දැඩිව රෝගාතුරව සිටින ප්‍රවීණ කලාකරුවකුගේ පිළිකා, වකුගඩු බරපතල හදිසි අනතුරු හා බරපතල හෘද ස්නායු හා මොලය ආශ්‍රිත රෝග සඳහා වෛද්‍යාධාර පිණිස හෝ අවුරුදු 75 ඉක්මවූ ප්‍රවීණ කලාකරුවකුගේ අවසාන ප්‍රසංගය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් විනෝද බදු නිදහස් කළ ප්‍රසංගයක් (ජීවිත කාලය තුළ එක් වරක්) | අය නොකෙරේ |

12-76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.